නුවන් ලසන්ත විජේනායක
පුත්තලම පාර,
සාලියවැව හංදිය.

2025.02.20

ස්ථානාධිපතිතුමා
ශ්‍රී ලංකා පොලිසිය,
ඉපලෝගම.

*ස්ථානාධිපතිතුමනි,*

**<u>සමාජ මාධ්‍ය මගින් මාගේ ඡායාරූපයක් අවභාවිතා කිරීම සම්බන්ධව</u>**

ඉහත නම, ලිපිනය සඳහන් මා දැනට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ රියදුරු වශයෙන් කටයුතු කරමි.

පසුගිය දිනවල විවිධ ප්‍රදේශවල සිදු වූ මිනී මැරුම් සම්බන්ධව සමාජ මාධ්‍ය මගින් විවිධ අදහස්, මතවාද හා විවේචන ඉදිරිපත් කර තිබුණි. ඒ අතර හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිදුවූ අරුන විදානගමගේ නැමැත්තාගේ (කජ්ජා) මරණයට අදාළව එම මියගිය අරුන විදානගමගේ (කජ්ජා) නැමති අය ලෙස මාගේ ඡායාරූපයක් යොදාගෙන මුහුණුපොතෙහි (fb) පෝස්ට් පල කර ඇත.

එමගින් මා හට ජීවිත අවධානමක් මෙන්ම සමාජයේ විවිධ චෝදනාවන්ට හා විවේචනයන්ට හා බලපෑම්වලට ලක්වෙමින් සිටිමි. ඒ වගේම මා දෙදරු පියෙක් වන බැවින් මාගේ බිරිදට සහ දරුවන්ට ද ජීවිත තර්ජනයක් එල්ල වීමට ඉඩ ඇත. එමෙන්ම ඔවුනට සමාජ විරෝධයක් සහ අපකීර්තියක් ද එල්ල විය හැක.

එමෙන්ම එම ඡායාරූපයේ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමා ද සිටින බැවින්, එතුමාගේ කීර්ති නාමයට හානිවනවා මෙන්ම, සමාජ විරෝධයක් සහ තර්ජනයක් එල්ල විය හැකිය.

එමනිසා ඉහත කරුණු පිළිබඳ අවධානය යොමුකර ගරු නාමල් රාජපක්ෂ මහතා සමග සිටින මාගේ ඡායාරූපය අවභාවිතා කරමින් මේ ආකාරයට සිදු කරන ක්‍රියාවන් හේතුවෙන් මේ වන විට මාගේ ජීවිතය දැඩි අවධානම් තත්තවයකට පත්ව ඇති හෙයින් ඊට අදාළව සමාජ මාධ්‍යයේ ප්‍රචාරණ සහ පෝස්ට්, කමෙන්ට් පලකරන සියල්ල සමාජ මාධ්‍යයෙන් ඉවත් කරන ලෙසත්, එසේ පෝස්ට්, කමෙන්ට් පල කරන මුහුණ පොතෙහි ගිණුම් හිමියන්ට සහ එකී සමාජ මාධ්‍ය ප්‍රචාරණ තවදුරටත් හුවමාරු කරන පුද්ගලයින්ට විරුද්ධව ගත හැකි සියලුම නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

මුහුණු පොතෙහි (FB) පලවූ පෝස්ට්වලට අදාල වෙබ් සබැඳිය (link) පහත දක්වා ඇති අතර, අදාළ ස්ක්‍රීන්ෂොට් අමුණා ඇත.

https://www.facebook.com/share/p/1ACoq1fR5t/ තිත්ත උනත් ඇත්ත thiththa unath aththa

https://www.facebook.com/share/p/1ACoq1fR5t/ kalana weerakoon

https://www.facebook.com/share/p/1Bn25aypNj/ sanjaya sidath kumarathunga

https://www.facebook.com/share/p/165bggNLey/ කටප්පා බාහුබලී

https://www.facebook.com/profile.php?id=100054380141053&mibextid=ZbWKwL s k charith (comment - screenshot)

Sudath ariyawansha (comment - screenshot)

ස්තුතියි.

මෙයට විශ්වාසී,

නුවන් ලසන්ත විජේනායක
890440533V